AL/2020/25 C/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නූතන ලෝක ඉතිහාසය II (I කොටස)
நவீன உலக வரலாறு II (பகுதி I)
Modern World History II (Part I)

25 C S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

විභාග අංකය: ....................................

**උපදෙස්:**

- මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
- කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) ඇන්ඩීස් (2) ඇපලාචියන් (3) ආර්ක්ටික් (4) ඇල්ප්ස් (5) ඇට්ලස් (......)

2. (1) සුමාත්‍රා (2) ජාවා (3) බෝර්නියෝ (4) සෙලිබීස් (5) කියුබා (......)

3. (1) කියෝතෝ (2) බීජිං (3) ෂැංහයි (4) නැංකිං (5) වූහාං (......)

4. (1) ඩොනටෙලෝ (2) මෙඩිචි (3) ලෙනාඩෝ ඩා වින්චි (4) රෆායල් (5) ටිටියන් (......)

5. (1) නාවික හෙන්රි (2) ජෝන් කැබෝ (3) ජොලියට් (4) ලා සලේ (5) හෙන්රි හඩ්සන් (......)

6. (1) උත්කෘෂ්ට විප්ලවය (2) අමෙරිකන් විප්ලවය (3) කාර්මික විප්ලවය (4) රුසියන් විප්ලවය (5) චීන විප්ලවය (......)

7. (1) මහාද්වීපික ක්‍රමය (2) මොන්රෝ න්‍යාය (3) නව දීමනාව (New Deal) (4) ට්‍රෲමන් න්‍යාය (5) මාර්ෂල් සැලැස්ම (......)

8. (1) වුඩ්රෝ විල්සන් (2) ලොයිඩ් ජෝර්ජ් (3) ජෝර්ජ් ක්ලෙමන්සෝ (4) විටෝරියෝ ඕලැන්ඩෝ (5) ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් (......)

[දෙවැනි පිටුව බලන්න.

**9.** (1) යුනිසෙෆ් (UNICEF) (2) නේටෝ (NATO) (3) සාර්ක් (SAARC)
(4) සෙන්ටෝ (CENTO) (5) ආසියාන් (ASEAN) (……)

**10.** (1) ජවහර්ලාල් නේරු (2) රාජේන්ද්‍ර ප්‍රසාද් (3) ලාල් බහදූර් ශාස්ත්‍රී
(4) ඉන්දිරා ගාන්ධි (5) මොරාජි දේසායි (……)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද එකිනෙකට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.**
(1) නව ලෝකය - අමෙරිකා මහාද්වීපය
(2) අඳුරු මහාද්වීපය - අප්‍රිකා මහාද්වීපය
(3) නිදාසිටින යෝධයා - චීනය
(4) සාප්පුකාර ජාතිය - ප්‍රංශය
(5) කිරුළේ මාණික්‍යය - ඉන්දියාව (……)

**12.**
(1) අල්ෆොන්සෝ ද ඇල්බකර්ක් - පෘතුගීසි
(2) හර්නැන්ඩෝ කෝර්ටිස් - ස්පාඤ්ඤ
(3) ප්‍රැන්සිස්කෝ පිසාරෝ - ලන්දේසි
(4) ජෝශප්-ප්‍රැන්සිස් ඩූප්ලේ - ප්‍රංශ
(5) රොබට් ක්ලයිව් - ඉංග්‍රීසි (……)

**13.**
(1) ටොකුගාවා - ජපානය
(2) මැංචු - චීනය
(3) චක්‍රි - සියම
(4) කොන්බවුං - කාම්බෝජය
(5) න්ගුයෙන් - වියට්නාමය (……)

**14.**
(1) එස්ටේට්ස් ජෙනරල් - එංගලන්තය
(2) කොංග්‍රසය - අමෙරිකා එක්සත් ජනපදය
(3) ලෝක් සභා - ඉන්දියාව
(4) බුන්ඩෙස්රාට් - ජර්මනිය
(5) ජාතික මහජන කොංග්‍රසය - චීනය (……)

**15.**
(1) පැරිස් ගිවිසුම (1783) - අමෙරිකානුවන් සහ එංගලන්තය
(2) යැන්ඩබෝ ගිවිසුම (1826) - එංගලන්තය සහ බුරුමය
(3) නැංකිං ගිවිසුම (1842) - එංගලන්තය සහ චීනය
(4) පෝට්ස්මත් ගිවිසුම (1905) - ජපානය සහ රුසියාව
(5) රෝම ගිවිසුම (1957) - ඊජිප්තුව සහ එංගලන්තය (……)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරය, **X** තීරය සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | "රාජ්‍යය යනු මම වෙමි." | A | නැපෝලියන් බොනපාට් |
| (ii) | "විප්ලවය යනු මම වෙමි." | B | දාහතරවන ලුවී |
| (iii) | "නිර්ධනයන්ට ඔවුන් බැඳ තබා ඇති දම්වැල් හැර අහිමිවීමට අන් කිසිවක් නොමැත. ඔවුන්ට දිනාගැනීමට ලෝකයක් ඇත." | C | මාඕ සේ තුං |
| (iv) | "තත්කාලීන වැදගත් ප්‍රශ්න විසඳනු ලබන්නේ කථා පැවැත්වීමෙන් හෝ බහුතර ඡන්දයෙන් හෝ නොවේ . . . . ලෙයින් සහ යකඩෙනි." | D | කාල් මාක්ස් |
| (v) | "මල් සියයක් පිපේවා; මතවාද සියයක් සටන්වදීවා!" | E | බිස්මාර්ක් |

(1) ABCDE (2) BADEC (3) BDAEC (4) ECDBA (5) EDACB (……)

[තුන්වැනි පිටුව බලන්න.

**17.**

| X | Y |
|---|---|
| (i) බ්‍රහ්මො සමාජ් | A ස්වාමි විවේකානන්ද |
| (ii) ආර්ය සමාජ් | B රබීන්ද්‍රනාත් තාගෝර් |
| (iii) ඉන්දියානු ජාතික සංගමය | C දයානන්ද සරස්වතී |
| (iv) රාමක්‍රිෂ්ණ මිසම | D ඩබ්ලියු.සී. බැනර්ජි |
| (v) ශාන්තිනිකේතනය | E රාජා රාම් මෝහන් රෝයි |

(1) DABEC (2) DACBE (3) DEACB (4) ECDAB (5) EDBCA (……)

**18.**

| X | Y |
|---|---|
| (i) රතු කමිස හමුදාව | A බොල්ෂෙවික් විරෝධී කණ්ඩායමකි. |
| (ii) රතු හමුදාව | B හිට්ලර් |
| (iii) ධවල හමුදාව | C මුසෝලිනී |
| (iv) කළු කමිස හමුදාව | D ගැරිබෝල්ඩි |
| (v) දුඹුරු කමිස හමුදාව | E ට්‍රොට්ස්කි |

(1) ACEBD (2) BCAED (3) BEACD (4) BEDCA (5) DEACB (……)

**19.**

| X | Y |
|---|---|
| (i) සුන් යත් සෙන් | A පාකිස්තානයේ පියා |
| (ii) මොහොමඩ් අලි ජින්නා | B මැලේසියාවේ ප්‍රථම අගමැති |
| (iii) ඌ නූ | C බංග්ලාදේශයේ සමාරම්භකයා |
| (iv) තුන්කු අබ්දුල් රහමාන් | D 1911 චීන සමූහාණ්ඩුවේ පියා |
| (v) ෂීක් මුජිබර් රහමන් | E බුරුමයේ ප්‍රථම අගමැති |

(1) ABDEC (2) CEABD (3) DAEBC (4) DEBAC (5) ECADB (……)

**20.**

| X | Y |
|---|---|
| (i) ඉරාකය | A ෆෝමෝසා |
| (ii) ඉරානය | B බුරුමය |
| (iii) තායිවානය | C සියම |
| (iv) මියන්මාරය | D පර්සියාව |
| (v) තායිලන්තය | E මෙසොපොතේමියාව |

(1) ACBED (2) BDAEC (3) CADBE (4) ECABD (5) EDABC (……)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. 1688 - 89 උත්කෘෂ්ට විප්ලවය**

(1) පළමුවන චාල්ස් රජු පාර්ලිමේන්තු පනතක් මගින් මරණීය දඬුවමට ලක් කරන ලදී.
(2) ඔරෙන්ජ්හි විලියම් සහ මේරි එංගලන්තයේ ඒකාබද්ධ පාලකයන් බවට පත්වූහ.
(3) උත්කෘෂ්ට විප්ලවය, එංගලන්තයේ ස්ථාවර ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවකට පදනම දැමීය.
(4) ප්‍රොතෙස්තාන්තවරුන් පමණක් රජ විය යුතු යැයි ප්‍රකාශ කෙරිණ. (……)
(5) අයිතිවාසිකම් පනත සම්මත කෙරිණ.

**22. අමෙරිකන් විප්ලවය**

(1) බොස්ටන් තේ සාදය
(2) ෆිලඩෙල්ෆියාවේ මහාද්වීපික සම්මේලනය
(3) හිම සමය
(4) 1776 ස්වාධීනතා ප්‍රකාශනය
(5) සරටෝගාහි දී හා යෝක්ටවුන්හි දී අමෙරිකානුවන් ලත් ජයග්‍රහණය (……)

**23.** **කාර්මික විප්ලව සමයේ නව උත්පාදන**

(1) දුවන නඩාව
(2) සුළං මෝල
(3) ස්පිනිං ජෙනිය
(4) ජල රාමුව
(5) වාෂ්ප ඇන්ජිම (......)

**24.** **මෙයිජි ප්‍රතිස්ථාපනය**

(1) මෙයිජි ප්‍රතිස්ථාපනය ටොකුගාවා යුගයේ අවසානය සලකුණු කරයි.
(2) ටොකුගාවා ෂෝගන් පාලනයේ දුර්වලතා සහ විදේශ පීඩනය මෙයිජි ප්‍රතිස්ථාපනය ඇතිවීම සඳහා අවශ්‍ය වාතාවරණය නිර්මාණය කළේ ය.
(3) මෙයිජි ප්‍රතිස්ථාපනය මගින් ජපන් අධිරාජයාගේ බලතල යළි ස්ථාපිත කරන ලදී.
(4) ෂොගන්වරයා, පරිපාලන ක්‍රමය තුළ වඩාත්ම බලවත් පුද්ගලයා බවට පත්විය.
(5) මෙයිජි ප්‍රතිස්ථාපනයෙන් පසු ශීඝ්‍ර ප්‍රතිසංස්කරණ අවධියක් ඇති විය. (......)

**25.** **ඉන්දුනීසියාව**

(1) 1949 තෙක් ඉන්දුනීසියාව ලන්දේසි පාලනය යටතේ පැවතුණි.
(2) දෙවන ලෝක යුද්ධ සමයේ දී ඉන්දුනීසියාව ජපානය විසින් යටත්කර ගන්නා ලදී.
(3) ඉන්දුනීසියාවේ නිදහස් ව්‍යාපාරය අච්මඩ් සුකර්ණෝ විසින් මෙහෙයවන ලදී.
(4) සුකර්ණෝ නිදහස් ඉන්දුනීසියාවේ ප්‍රථම ජනාධිපතිවරයා බවට පත්විය.
(5) සුකර්ණෝගෙන් අනතුරුව ලී කුවාන් යූ ජනාධිපති වශයෙන් පත්විය. (......)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,
**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ............ **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය. |

**26.** **ස්පාඤ්ඤ යටත්විජිත අධිරාජ්‍යය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**

(A) ස්පාඤ්ඤයෝ මධ්‍යම හා දකුණු අමෙරිකාවේ ප්‍රදේශ බොහොමයක් යටත් කළහ.
(B) ස්පාඤ්ඤයෝ පිලිපීන දූපත්වල ස්වකීය බලය පිහිටවූහ.
(C) ෆර්ඩිනන්ඩ් මැගලන් පිලිපීන දූපත්වල ප්‍රථම ස්පාඤ්ඤ ආණ්ඩුකාරවරයා ලෙස පත්කරන ලදී.
(D) ස්පාඤ්ඤ පෙරදිග අධිරාජ්‍යයේ මූලස්ථානය ගෝවේහි ස්ථාපිත කොට තිබුණි. (......)

**27.** **රුසියන් විප්ලවය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**

(A) රුසියන් විප්ලවය, රුසියාවේ මෙන්ම ලෝකයේම ඉතිහාසය සම්බන්ධයෙන් බලපෑමක් ඇති කළේ ය.
(B) යුද හමුදාමය, කාර්මික හා කෘෂිකාර්මික ගැටලු විසඳීමට තාවකාලික ආණ්ඩුව අපොහොසත් විය.
(C) "කම්කරුවන්ට පාන්, ගොවීන්ට ඉඩම්, සැම දෙනාටම සාමය" ප්‍රධාන සටන්පාඨය විය.
(D) ලෙනින් හා ට්‍රොට්ස්කි ප්‍රධාන නායකයෝ වූහ. (......)

**28. ජාතීන්ගේ සංගමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**

(A) ජාතීන්ගේ සංගමය ලොයිඩ් ජෝර්ජ්ගේ සංකල්පයක් විය.

(B) පළමුවන ලෝක යුද්ධය අවසානයේ ජාතීන්ගේ සංගමය පිහිටුවන ලදී.

(C) ජාතීන්ගේ සංගමයේ ප්‍රධාන පරමාර්ථය වූයේ ලෝක සාමය පවත්වාගෙන යාම හා ජාත්‍යන්තර සහයෝගිතාව දිරිමත් කිරීමයි.

(D) අමෙරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු විය. (......)

**29. දෙවන ලෝක යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**

(A) ඉතාලියේ සහ ජර්මනියේ අධිපතිවාදී පාලන තන්ත්‍ර නැගී ඒම දෙවන ලෝක යුද්ධය ඇතිවීම නොවැළැක්විය හැකි තත්ත්වයක් බවට පත් කළේ ය.

(B) ප්‍රැන්සිස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා ඝාතනය කරනු ලැබීම දෙවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් ආසන්නතම හේතුව විය.

(C) ජපානය තුළ යුද්ධකාමිත්වය නැගී ඒම දෙවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් වැදගත් හේතුවකි.

(D) ජර්මානුවන් විසින් ලුසිටානියාව සාගරයේ ගිල්ලවීම අමෙරිකා එක්සත් ජනපදය දෙවන ලෝක යුද්ධයට ගෙනාවේ ය. (......)

**30. දෙවන ලෝක යුද්ධයෙන් පසු ජර්මනිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**

(A) 1945 මැයි මස ජර්මනිය මිත්‍ර පාක්ෂික හමුදාවලට යටත් විය.

(B) 1949 දී ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව පිහිටුවන ලදී.

(C) නැගෙනහිර ජර්මනිය සෝවියට් ආධිපත්‍යය යටතේ පැවතුණි.

(D) තුෂ්ණී යුද්ධය අවසන්වීමෙන් පසු නැගෙනහිර හා බටහිර ජර්මන් ප්‍රදේශ යළි ඒකාබද්ධ කෙරිණ. (......)

- අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයක ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31. පෙරදිග ලන්දේසි යටත් විජිත අධිරාජ්‍යයේ ප්‍රධාන නිර්මාතෘවරයා ලෙස සැළකෙන්නේ කවරෙක් ද?**

(1) යාකොබ් ෆන් නෙක් (2) පීටර් බොත් (3) යාන් පීටර්සෝ කුන්
(4) හර්මන් ඩාන්ඩෙල්ස් (5) ෆන් ඩන් බොෂ් (......)

**32. ඇපාර්තීඩ් නමින් හඳුන්වන ලද ජනවර්ග වෙන්කර තැබීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ, අප්‍රිකාවේ පිහිටි බ්‍රිතාන්‍ය යටත්විජිතය කුමක් ද?**

(1) ඊජිප්තුව (2) සුඩානය (3) නයිජීරියාව
(4) කෙන්යාව (5) දකුණු අප්‍රිකාව (......)

**33. කෙන්යාවේ නිදහස් ව්‍යාපාරයේ නායකයා කවුද?**

(1) ක්වාමේ නිකෲමා (2) ජෝමෝ කෙන්යාටා (3) මිල්ටන් ඔබෝටේ
(4) ජූලියස් නියරේරේ (5) පැට්‍රිස් ලුමුම්බා (......)

**34. සාමකාමී සහජීවනය පිළිබඳ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කළ සෝවියට් නායකයා කවුද?**

(1) නිකිතා කෘෂ්චෙෆ් (2) ඇලෙක්සි කොසිගින් (3) ලියනොඩ් බ්‍රෙෂ්නෙෆ්
(4) අන්ද්‍රපොෆ් (5) චර්නෙන්කෝ (......)

**35. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම ආසියාතික මහා ලේකම්වරයා කවුද?**

(1) ට්‍රිග්වි ලී (2) ඌ තාන්ට් (3) නෙ වින්
(4) කුර්ට් වෝල්ඩ්හයිම් (5) පෙරේස් ඩි කුවේලාර් (......)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | චාර්ටිස්ට් ව්‍යාපාරය වැඩිහිටි පිරිමි ඡන්ද බලය හා වෙනත් ඡන්ද ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටියේ ය. | 1848 විප්ලවය ප්‍රංශය තුළ දෙවන සමූහාණ්ඩුව පිහිටුවීම සඳහා මඟ පෑදී ය. | (.........) |
| **37.** | පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යයේ නායකත්වය යටතේ ඉතාලි එක්සත්භාවය සාක්ෂාත් කරගන්නා ලදී. | 1852 දී ගැරිබෝල්ඩි පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යයේ ප්‍රධාන ඇමතිවරයා බවට පත් විය. | (.........) |
| **38.** | චියැං කායි ෂෙක් විසින් 1921 දී චීන කොමියුනිස්ට් පක්ෂය පිහිටුවන ලදී. | ස්වීඩනයේ ඩැග් හැමර්ෂල් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම මහාලේකම් විය. | (.........) |
| **39.** | පළමුවන ලෝක යුද්ධය ආරම්භවීමත් සමග නිරවි යුද්ධය ආරම්භ විය. | බෝල්ටික් සිට අද්‍රියාතික් දක්වා යුරෝපා මහාද්වීපය හරහා අයෝමය කඩතුරාවක් වැටී ඇතැයි වින්ස්ටන් චර්චිල් 1946 දී ප්‍රකාශ කළේ ය. | (.........) |
| **40.** | ජපානයේ ආණ්ඩුක්‍රමය තුළ මූලික වෙනසක් ඇති කළ 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව පැවතුණි. | 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සමස්තයක් වශයෙන් ජපන් ජනතාව වෙත පරමාධිපත්‍යය පවරන ලද අතර ඔවුන්ට පුවත්පත් නිදහස, රැස්වීම් පැවැත්වීමේ නිදහස හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව වැනි අයිතිවාසිකම් ද ලබා දෙන ලදී. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | | |
|---|---|---|---|
| නූතන ලෝක ඉතිහාසය | II | (II කොටස) | 25 C S II |
| நவீன உலக வரலாறு | II | (பகுதி II) | |
| Modern World History | II | (Part II) | |

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

උපදෙස්:
- ✳ **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ✳ **පළමුවැනි** ප්‍රශ්නයටත් **B** හා **C** කොටස්වලින් අවම වශයෙන් **එක** ප්‍රශ්නය බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
  (**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ලෝකයේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) ටෝකියෝ | (ii) පිලිපීන දූපත් | (iii) මලක්කා සමුද්‍ර සන්ධිය |
| (iv) සින්ධු ගඟ | (v) කැස්පියන් මුහුද | (vi) කොන්ස්තන්තිනෝපල් |
| (vii) පිරනීස් කඳුවැටිය | (viii) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය | (ix) සුවස් ඇළ |
| (x) නයිජීරියාව | (xi) බ්‍රසීලය | (xii) මිසිසිපි ගඟ |

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි)*

## B කොටස

**2.** පහළොස්වන හා දහසයවන සියවස්වල යුරෝපයේ ඇති වූ ආර්ථික, සමාජ හා දේශපාලන වෙනස්වීම් පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**3.** "ප්‍රංශ විප්ලවය යුරෝපයේ ඉතිහාසය හැඩගැස් වූ තීරණාත්මක අවධියක් විය."
- (i) ප්‍රංශ විප්ලවය ඇතිවීමට ආසන්නයේ කැඳවනු ලැබූ නියෝජිත සභාව නම් කරන්න. (ලකුණු 01 යි)
- (ii) ප්‍රංශ විප්ලවය ඇතිවීම කෙරෙහි බලපෑ බවට සැලකෙන දාර්ශනිකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)
- (iii) ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)
- (iv) ප්‍රංශ විප්ලවය යුරෝපයේ ඉතිහාසය හැඩගැස් වූ තීරණාත්මක අවධියක් ලෙස සැලකෙන්නේ මන්දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 09 යි)

**4.**
- (i) "නව අධිරාජ්‍යවාදය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05 යි)
- (ii) නව අධිරාජ්‍යවාදය, පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට කෙතෙක් දුරට හේතු වී ද? (ලකුණු 11 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
- (i) ජෝර්ජ් වොෂිංටන්
- (ii) එංගලන්තයේ කාර්මික විප්ලවය ඇතිවීමට තුඩුදුන් සාධක
- (iii) ඔටෝ ෆොන් බිස්මාර්ක්
- (iv) වර්සායි ගිවිසුම

*(එක් කෙටි සටහනකට ලකුණු **08** බැගිනි)*

[අටවැනි පිටුව බලන්න.

## C කොටස

**6.** 1919 සිට 1947 දක්වා ඉන්දියානු නිදහස් අරගලයේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 16 යි)

**7.** ඉතාලියේ ෆැසිස්ට්වාදය හා ජර්මනියේ නට්සිවාදය නැඟී ඒමට තුඩුදුන් සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**8.** "එක්සත් ජාතීන්ගේ සංවිධානය සාම සාධක මණ්ඩලයක් වශයෙන් සාක්ෂාත් කරගෙන ඇත්තේ අර්ධ සාර්ථකත්වයක් පමණකි."

(i) එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය කෙටුම්පත් කරනු ලැබූ සම්මේලනය නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අරමුණු **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) 1968 චෙකොස්ලොවැකියා අර්බුදය තෙක් එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධ වූ **ප්‍රධාන ගැටුම්** ඇසුරෙන් සාමසාධක මණ්ඩලයක් වශයෙන් එම සංවිධානය කෙතෙක් දුරට සාර්ථක වී ඇත්දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**9.** පහත සඳහන් නායකයන් අතුරෙන් ඕනෑම **දෙදෙනෙකුගේ** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ජෝශප් ස්ටාලින්

(ii) මාඕ සේ-තුං

(iii) හෝ චි මිං

(iv) ජවහර්ලාල් නේරු

*(එක් කෙටි සටහනකට ලකුණු **08** බැගින්)*

* * *